# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1991 අංක 7 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන්වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන්වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 8 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1991 මාර්තු මස 8 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1991 අංක 7 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන්වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත.

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 59/89

**ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන්වහන්සේ සහ** රාජගුරු ප්‍රසාදීන්වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය **කිරීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

මෙතෙක් කල් හලාවත රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ආගමික බල ප්‍රදේශය යටතේ පැවති ප්‍රදේශයෙන් කොටසක් කුරුණෑගල රෝමානු කතෝලික රදගුරු වසම නමින් නව රදගුරු වසමක් බවට පත් කොට එය පරිපාලනය කිරීම සඳහා, අතිගරු දේවධර්මාචාර්ය රේමන් පීරිස් රාජගුරු ප්‍රසාදීන්වහන්සේ කුරුණෑගල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන්වහන්සේ වශයෙන් යථා පරිදි පත් කරනු ලැබ ඇති හෙයින් ද :

කුරුණෑගල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන්වහන්සේ අන්තර්ගත කිරීමට විධිවිධාන සැලැස්වෙන පරිදි සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් ද ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන්වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන්වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම අවශ්‍යානුකූල වන හෙයින් ද :

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

කෙටි නාමය.

1. මේ පනත 1991 අංක 7 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන්වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන්වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

338 වන අධිකාරයේ පූර්විකාව සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන්වහන්සේලා පිළිබඳ ආඥා පනතේ පූර්විකාව එහි වූ "දේපළ පැවරීමේ සාධන පත්‍ර කාර්ය සඳහා" යන වචන ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඇ වන වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3ආ වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කෙරෙන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඇ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"කුරුණෑගල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීම.

3ඇ. කුරුණෑගල රාජගුරු ප්‍රසාදීන්වහන්සේ, එනම් අතිගරු දේවධර්මාචාර්ය රේමන් පීරිස් රාජගුරු ප්‍රසාදීන්වහන්සේ, සහ රෝමානු කතෝලික නීති සහ ව්‍යවහාරයන් අනුව යථා පරිදි පත් කරනු ලබන එතුමන්ගේ අනුප්‍රාප්තිකයන් ද සංස්ථාවක් වන අතර ඒ සංස්ථාව මේ ආඥාපනතේ සියලු කාර්ය සඳහා "කුරුණෑගල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන්වහන්සේ" යන නමින් හැඳින්වෙන්නේය. තවද එම නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් එයට ඇති

2—ඩ 00,000—5,485 (89/10

අතර සෑම වර්ගයක ම චංචල හා නිශ්චල දේපළ අත්කර ගැනීමේ, මිලට ගැනීමේ, ලබා ගැනීමේ, දරා සිටීමේ හා භුක්ති විඳීමේ ද එකී දේපළ විකිණීමේ ද ඒ පිළිබඳව අන් ආකාරයකින් සුදුස්සක් කිරීමේ ද පූර්ණ බලය ඒ සංස්ථාවට ඇත්තේය. ඒ දේපළ සම්බන්ධයෙන් ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින්ද සංස්ථාවට විරුද්ධ ව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5ආ වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කෙරෙන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5ඇ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"කුරුණෑගල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත දේපළ සතු කර දීම.

5ඇ. එකී අතිගරු දේවධර්මාචාර්ය රේමන් පීරිස් රාජගුරු ප්‍රසාදීන්වහන්සේ විසින් උන්වහන්සේගේ නිල තත්ත්වයෙන් දැනට අත්කර ගෙන ඇති, දරනු ලබන හෝ සන්තකයෙහි තබා ගෙන සිටින චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම සියලු දේපළ ඒවා කෙරෙහි බලපාන යම් භාරයකට හෝ කොන්දේසියකට හෝ යටත් ව එකී කුරුණෑගල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත සතු වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(4) කුරුණෑගල රෝමානු කතෝලික රදගුරුවසම ඇති කිරීමේ හේතුවෙන් කුරුණෑගල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ පරිපාලනයට යටත් වන්නා වූ සියලු චංචල හා නිශ්චල දේපළ සම්බන්ධයෙන් කුරුණෑගල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන්වහන්සේ නමට හලාවත රාජගුරු ප්‍රසාදීන්වහන්සේ විසින් ලියා අත්සන් කරන ලද යම් හිමිකර දීමේ හෝ පැවරීමේ කවර සාධන පත්‍රයකට වුව ද 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 2 වන වගන්තිය යටතේ යම් සාධන පත්‍රයක් සඳහා අය කරනු ලබන නියමිත මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 සි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.